// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
අති විශෙෂ
අංක 2282/23 - 2022 මැයි මස 31 වැනි අඟහරුවාදා - 2022.05.31
(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත

### 2 වැනි වගන්තිය යටතේ නියමය

2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය රනිල් වික්‍රමසිංහ වන මම, මෙහි උපලේඛනයේ (i) වන තීරයේ නිශ්චිතව දක්වා ඇති වෙළඳ භාණ්ඩ සම්බන්ධයෙන්, එම උපලේඛනයේ (ii) වන තීරයේ අනුරූප සටහන් වල නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණය මත විශේෂ වෙළඳ භාණ්ඩ බද්දක්, මෙම නියමය මගින් පනවමි.

මෙම නියමය 2022 ජුනි මස 01 දින සිට ආරම්භ වන මාස 06 කාල සීමාවක් සඳහා, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, වලංගුව පැවතිය යුතුය.

2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ පනවන ලද 2022 මාර්තු මස 09 දිනැති අංක 2270/19 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශිත නියමය සහ 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 5 වැනි වගන්තිය යටතේ පනවන ලද 2022 මාර්තු මස 28 දිනැති අංක 2273/01 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශිත නියමය 2022 ජුනි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි අවලංගු කරමි.

රනිල් වික්‍රමසිංහ,
මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ
ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය.

2022 මැයි මස 31 වැනි දින,
කොළඹ 01,
මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ දී ය.

1A - PG 5854 - 481(2022/06)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www. documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## උපලේඛනය

| *(i) වන තීරය* | | | | *(ii) වන තීරය* |
|---|---|---|---|---|
| *වෙළඳ භාණ්ඩය* | | | | *විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද* |
| | *සං. ව. ශීර්ෂය* | *සං.ව. සංකේතය* | *විස්තරය* | |
| 01. | 04.03 | 0403.10 | යෝගට් | කි. ග්‍රෑමයට රු. 2,000/- |
| | | 0403.90 | අනෙකුත් | කි. ග්‍රෑමයට රු. 2,000/- |
| 02 | 04.05 | 0405.10 | වෙඬරු | කි. ග්‍රෑමයට රු. 1,500/- |
| | | 0405.20 | කිරි වලින් නිපදවූ තැවරුම් | කි. ග්‍රෑමයට රු. 2,000/- |
| | | 0405.90 | අනෙකුත් | කි. ග්‍රෑමයට රු. 2,000/- |
| 03 | 04.06 | 0406.20 | සියළුම වර්ගවල පෙරන් ගාන ලද හෝ පිටි කරන ලද කේජු | කි. ග්‍රෑමයට රු. 600/- |
| 04 | 08.04 | 0804.10.10 | රට ඉඳි - අළුත් | කි. ග්‍රෑමයට රු. 200/- |
| | | 0804.10.20 | රට ඉඳි - වියළි | කි. ග්‍රෑමයට රු. 200/- |
| 05 | 08.05 | 0805.10.10 | දොඩම් - අළුත් | කි. ග්‍රෑමයට රු. 600/- |
| 06 | 08.06 | 0806.10 | මිදි - අළුත් | කි. ග්‍රෑමයට රු. 600/- |
| 07 | | 0806.20 | මිදි - වියළි | කි. ග්‍රෑමයට රු. 600/- |
| 08 | 08.08 | 0808.10 | ඇපල් | කි. ග්‍රෑමයට රු. 600/- |
| 09 | 08.10 | 0810.90.90 | අනෙකුත් (පළතුරු) | කි. ග්‍රෑමයට රු. 600/- |

EOG 06 - 0029

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.